සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

## I කොටස

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
* අංක 1 -20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉන්දියාවේ සිට මෙරටට පැමිණි සංක්‍රමණික කණ්ඩායම් තම ජනාවාස පිහිටුවා ගැනීමට වියළි කලාපය තෝරා ගත්තේ කුමන හේතුව නිසාද?
(1) ගමනාගමනය පහසුවීම නිසා ය.
(2) කෘෂි කටයුතු වලට යෝග්‍ය පස හා තැනිතලා බිම නිසා ය.
(3) මෝසම් වර්ෂාව ලැබෙන නිසා ය.
(4) තෙත් කලාපීය ප්‍රදේශවලට යාමට බාධා පැමිණි නිසා ය.

(02) මල්වතුඔය හරහා ඉදිකොට ඇති තේක්කම් අමුණ පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තාවකාලික වේල්ලක් සහිත අමුණකි.
(2) ලී කණු සිටුවා වැලි පස් අතුරා සකස් කොට ඇත.
(3) ස්ථාවර වේල්ලක් සහිත පුරාණ අමුණකි.
(4) තේක්කම් අමුණේ සිට කලාවැවට ජලය ගෙන යයි.

(03) ලංකා ඉතිහාසයේ මුල් වරට උයනක් තනවන ලද්දේ,
(1) මුටසීව රජු විසිනි. (2) දේවානම්පියතිස්ස රජු විසිනි.
(3) පළමුවන පරාක්‍රමබාහු රජු විසිනි. (4) පළමුවන කාශ්‍යප රජු විසිනි.

(04) මහායාන අදහස් පැතිර යාමත් සමග ජනප්‍රිය වූ වන්දනා ක්‍රමය කුමක්ද?
(1) බෝධීන් වහන්සේ වන්දනය (2) වෙහෙර වහන්සේ වන්දනය
(3) ධාතූන් වහන්සේලා වන්දනය (4) බෝධිසත්ව ප්‍රතිමා වන්දනය

(05) පොළොන්නරුවේ සඳකඩපහණින් වෘෂභ රූපය ඉවත් වන්නේ කුමන ආගමික බලපෑමක් නිසාද?
(1) ජෛන ආගමික (2) ඉස්ලාම් ආගමික
(3) හින්දු ආගමික (4) බෞද්ධ ආගමික

(06) මහනුවර නගරයට ආරක්ෂාව සැපයූ දුර්ග දෙකක් සඳහන් පිළිතුර තෝරන්න.
(1) ගලගෙදර - කටුගස්තොට (2) බලන - හුන්නස්ගිරිය
(3) පිළිමතලාව - පේරාදෙණිය (4) කඩුගන්නාව - දන්තුරේ

(07) මහනුවර රාජධානිය ආරම්භ කරන ලද්දේ කුමන රජතුමා විසින්ද?
(1) පළමුවන රාජසිංහ රජු (2) කරලියද්දේ බණ්ඩාර රජු
(3) පළමුවන විමලධර්මසූරිය රජු (4) සේනා සම්මත වික්‍රමබාහු රජු

(08) ලන්දේසීන්ගේ සහය ලබාගෙන පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා දැමූ රජතුමා කවුරුන්ද?
(1) දෙවන රාජසිංහ රජු (2) සෙනරත් රජු
(3) පළමුවන රාජසිංහ රජු (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු

(09) මහනුවර රාජධානිය ආශ්‍රිතව පැවති වී ගොවිතැන පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වැව් ජලය මගින් ගොවිතැන් කටයුතු සිදුවිය.
(2) හෙල්මලු ක්‍රමයට ගොවිතැන් සිදුවිය.
(3) වී ගොවිතැන සිදු නොවුන අතර ගෙවතු වගාව සිදුවිය.
(4) වී ගොවිතැන සිදුවූයේ හේන්වල ය.

(10) යුරෝපා ඉතිහාසයේ මධ්‍යතන යුගය ලෙස සැලකෙන්නේ කුමන කාලයද?
(1) ක්‍රි:පූ: 1000 - 500 දක්වාය (2) ක්‍රි:ව: 500 -1000 දක්වාය
(3) ක්‍රි:ව: 1500 සිට මේ දක්වාය (4) ක්‍රි:ව: 500 - 1500 දක්වාය

(11) යුරෝපා පුනරුදය ආරම්භ වූ රට කුමක්ද?
(1) ඉතාලිය (2) රෝමය (3) ග්‍රීසිය (4) ප්‍රංශය

(12) පෘථිවිය පැතලි වස්තුවක්ය යන මතය නිශ්ප්‍රභ වූයේ,
(1) ජොහැන්නස් කෙප්ලර්ගේ නව සොයාගැනීම් නිසාය.
(2) ගැලීලියෝ ගැලිලිගේ නව සොයාගැනීම් නිසාය.
(3) කොපර්නිකස්ගේ නව සොයාගැනීම් නිසාය.
(4) අයිසැක් නිවුටන්ගේ නව සොයාගැනීම් නිසාය.

(13) මහාචාර්ය මාටින් ලූතර් කතෝලික සභාවෙන් නෙරපා දැමීමට බලපෑ හේතුව කුමක්ද?
(1) පව් සමාකිරීම පිළිබඳ ලියවිල්ලක් දේවස්ථානයේ දොරේ ඇලවීම
(2) පව් සමාකිරීමේ පත්‍ර විකිණීම
(3) රෙපරමාදු ව්‍යාපාරය ආරම්භ කිරීම
(4) පව් සමාකිරීමේ ලියවිල්ලක් විශ්ව විද්‍යාලය තුළ බෙදා හැරීම

★ **14 හා 15 ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය දී ඇති පිළිතුරු වලින් තෝරා යටින් ඉරක් අඳින්න.**

(14) 14 වන සියවස අගභාගය වන විට යුරෝපයේ ................ නගරයේ සිට ප්‍රධාන වෙළඳ මාර්ග තුනක් ආසියාතික ප්‍රදේශ වලට වැටී තිබිණි.
(1) ජිනෝවා (2) ඇලෙක්සැන්ඩ්‍රියා
(3) රෝම (4) කොන්ස්තන්තිනෝපල්

(15) ක්‍රි:ව: 1498 දී පෘතුගීසි ජාතික ...................... ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩ බැසීම සිදු විය.
(1) බර්තොලමියු ඩයස් (2) ලොරෙන්සෝ ද අල්මේදා
(3) වස්කෝ ද ගාමා (4) ප්‍රැන්සිස්කෝ ද අල්මේදා

(16) යුරෝපය හා ආසියාව අතර වෙළඳ සබඳතා ගොඩනගමින් අධික ලාභයක් උපයා ගැනීමට සමත් වූයේ කුමන ජාතිකයන්ද?
(1) රෝම ජාතිකයන් (2) මුස්ලිම් ජාතිකයන්
(3) ඉන්දියානු ජාතිකයන් (4) චීන ජාතිකයන

(17) පෘතුගීසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය කුමක්ද?
(1) ගෝව (2) කැලිකට් (3) බොම්බාය (4) බතාවිය

(18) මායාදුන්නේ රජතුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) පෘතුගීසීන් සමග සාමකාමීව කටයුතු කර ඇත.

(2) කොට්ටේ රාජධානියේ ආරම්භක පාලකයා ය.

(3) පෘතුගීසි වෙඩි පහරින් මරුමුවට පත් විය.

(4) සීතාවක රාජධානියේ ආරම්භක පාලකයා ය.

(19) මුල්ලේරියා සටනේදී දේශීය හමුදාවට නායකත්වය සපයන ලද්දේ,

(1) වීදීයබණ්ඩාර ය.

(2) ධර්මපාල කුමරු ය.

(3) ටිකිරි කුමරු ය.

(4) කොනප්පු බණ්ඩාර ය.

(20) කතෝලික ආගම ව්‍යාප්ත කිරීම සඳහා මෙරටට මුලින්ම පැමිණි ආගමික නිකාය වූයේ,

(1) ජෙසුයිට් වරුන් ය.

(2) ප්‍රැන්සිස්කන් වරුන් ය.

(3) ඩොමිනිකන් වරුන් ය.

(4) ඔගස්ටීනියන් වරුන් ය.

## II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

* අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

(01) A,B,C හා D වශයෙන් දක්වා ඇති පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A

(i) A පින්තූරයේ දක්නට ලැබෙන වැව කුමක්ද?


(ii) මෙය සාදවන ලද්දේ කුමන රජතුමා විසින්ද?

(iii) මෙහි දක්නට ලැබෙන චෛත්‍යයේ නම ලියා දක්වන්න?

(iv) මේවා පිහිටා ඇත්තේ කුමන නගරයේද?

(ලකුණු 1×4)

B



(i) B රූපයේ ඇති ගොඩනැගිල්ල කුමක් ද?

(ii) මෙය කරවන ලද රජතුමාගේ නම ලියන්න

(iii) මෙය නිර්මාණය වී ඇති සම්ප්‍රදාය කුමක්ද?

(iv) මෙම නිර්මාණය පිහිටි නගරයේ නම සඳහන් කරන්න

(ලකුණු 1×4)

C



(i) C පින්තූරයේ දැක්වෙන උපකරණය කුමක් ද?

(ii) එය දක්නට ලැබෙන විහාරය නම් කරන්න.

(iii) මෙහි තැම්පත් කර තිබූ පූජනීය වස්තුව කුමක්ද?

(iv) එය මහනුවරට වැඩම කරවන ලද්දේ කුමන රජතුමාද?

(ලකුණු 1×4)

D



(i) D පින්තූරයේ දැක්වෙන පුද්ගලයාගේ නම ලියන්න.

(ii) මොහු කුමන ජාතිකයෙක්ද?

(iii) මොහු කෝට්ටේ පාලකයින් සමග ඇතිකර ගත් ගිවිසුමේ නම ලියන්න.

(iv) එම ගිවිසුම අත්සන් කළේ කුමන වර්ෂයේ ද?

(ලකුණු 1×4)

(02) (i) පහත දක්වා ඇති මහ වැව් ඉදිකරවන ලද රජවරුන්ගේ නම් ලියා දක්වන්න.

a. කලාවැව

b. මහවිලච්චිය වැව (ලකුණු 02)

(ii) වැවක දැකිය හැකි ප්‍රධාන අංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) විශාල ප්‍රමාණයේ වැව් තැනීමේදී ලාංකිකයින් මුහුණ දුන් අභියෝග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදි කරවන ලද දාගැබ් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත A,B,C,D යටතේ දක්වා ඇති ඓතිහාසික ගොඩනැගිලි වලට උදාහරණ එක බැගින් ලියා දක්වන්න.

A - චෛතියසරය B - බෝධිසරය

C - රජ මාළිගය D - ආරෝග්‍යශාලාව (ලකුණු 04)

(iii) කැටයම් හා මූර්ති කලාව කෙරෙහි අතීත ශිල්පීන් තුළ පැවති නිපුණත්වය උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිත කළ නම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත A,B,C,D යටතේ දක්වා ඇති තොරතුරුවලට සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් නම් කරන්න.

A - වැලිවිට සරණංකර හිමිට සංඝරාජ තනතුර පිරිනැමීම

B - පළමු නායක්කර් වංශික රජතුමා

C - ක්‍රි:වඃ 1762 මහනුවරට පැමිණි ඉංග්‍රීසි දූතයා

D - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අත් අඩංගුවට ගත් ඉංග්‍රීසි ආණ්ඩුකාර වරයා (ලකුණු 04)

(iii) උඩරට රාජධානියේ පැවති චිත්‍ර කලාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) මධ්‍යතන යුගය අවසානයේ යුරෝපයේ බිහිවූ විශ්ව විද්‍යාල දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පුනරුද සමයේ පහත සඳහන් නිර්මාණ බිහිකළ පුද්ගලයින් A,B,C,D අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 04)

A - මොනාලිසා චිත්‍රය B - දුරේක්ෂය

C - මුද්‍රණ යන්ත්‍රය D - පියෙටා රූව

(iii) යුරෝපයේ පුනරුදය ඇති වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) දේශ ගවේෂණ ව්‍යාපාර වලට සම්බන්ධ වූ යුරෝපා රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) දේශ ගවේෂණ ව්‍යාපාර ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) පෘතුගීසීන් පැමිණෙන විට ලංකාවේ පැවති රාජධානි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සීතාවක රාජධානියේ උන්නතියට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මෙරට තුළ තම ආගම ප්‍රචාරය සඳහා පෘතුගීසීන් ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## ඉතිහාසය I

| | | | | |
|---|---|---|---|---|
| (1) 2 | (2) 3 | (3) 1 | (4) 4 | (5) 3 |
| (6) 2 | (7) 4 | (8) 1 | (9) 2 | (10) 4 |
| (11) 1 | (12) 3 | (13) 1 | (14) 4 | (15) 3 |
| (16) 2 | (17) 1 | (18) 4 | (19) 3 | (20) 2 |

(ලකුණු 2 × 20 = 40)

## ඉතිහාසය II

(01) A. (i) බසවක්කුලම වැව (ii) පණ්ඩුකාභය රජතුමා
(iii) රුවන්වැලි සෑය (iv) අනුරාධපුරයේ
(ලකුණු 1 × 4 = 4)

B. (i) ථූපාරාම පිළිමගේ (ii) මහා පරාක්‍රමබාහු රජු
(iii) ගෙඩිගේ සම්ප්‍රදාය (iv) පොළොන්නරුව
(ලකුණු 1 × 4 = 4)

C. (i) කුරක්කන් ගල (ii) කුරුවිට දෙල්ගමු විහාරය
(iii) දළදා වහන්සේ (iv) පළමුවන විමලධර්ම සූරියරජු
(ලකුණු 1 × 4 = 4)

D. (i) ජොරනිමෝද අසවේදු (ii) පෘතුගීසි
(iii) මල්වානේ ගිවිසුම (iv) ක්‍රි:ව: 1597 (ලකුණු 1 × 4 = 4)

(02) (i) a. ධාතුසේන රජු b. වසභ රජු
(ii) වැව් බැම්ම, සොරොව්ව, බිසෝකොටුව, සලපනාව, පිටවාන, ඇතුළු වාන
(iii) ★ වැවේ ජල පීඩනයට ඔරොත්තු දෙන පරිදි ශක්තිමත් බැම්මක් සකස් කිරීම.
★ වඩාත් උචිත ස්ථානය තෝරා ගැනීම.
★ ශ්‍රමය සපයා ගැනීම

(03) (i) පොළොන්නරුව, කිරි වෙහෙර, දෙමළ මහාසෑය, යුදගනාව දාගැබ, දැදිගම කොට වෙහෙර.
(ii) A. මැදිරිගිරිය/ පොළොන්නරුව
B. නිලක්කෙගම, ශ්‍රී මහා බෝධිය
C. වෛජයන්ත ප්‍රාසාදය/සීගිරිය/පඬුවස්නුවර/විජයබාහු මාළිගය

D. ආලාහන පිරිවෙන/ මිහින්තලය/ රිටිගල/ මැදිරිගිරිය

(iii) ★ සඳකඩපහණ කැටයම් ★ අවලෝකිතේශ්වර ප්‍රතිමා ★ පාර්වතී ප්‍රතිමා
★ බණ්ඨක චෛතිය වාහල්කඩ ★ නටරාජා ප්‍රතිමා

(04) (i) උඩරට, කන්දෙ නුවර, සෙංකඩගල

(ii) A - කීර්ති ශ්‍රී රාජසිංහ රජු B - ශ්‍රී විජය රාජසිංහ රජු
C - ජෝන් ෆයිබස් D - රොබට් බ්‍රවුන්රිග්

(iii) ★ බිත්ති තීරු වලට බෙදා චිත්‍ර ඇඳීම
★ බෞද්ධාගමික ජනකතා හා සිදුවීම්
★ දීර්ඝ කතා පියවරෙන් පියවර ඉදිරිපත් කිරීම චිත්‍රයට නැගීම
★ මල්, ගස් වැනි දේ හිස්තැන් පිරවීමට යොදා ගැනීම
★ රූපවල ගුණාත්මක භාවය නොසලකා තිබීම
★ ස්වභාවික වර්ණ භාවිතය හා සීමිත වර්ණ භාවිතය

(05) (i) පාදුවා, බොලොඤ්ඤා, ඔක්ස්පර්ඩ්, කේම්බ්‍රිජ්

(ii) A - ලියනාඩෝ ඩාවින්චි B - ගැලීලියෝ ගැලිලිගුටන්බර්ග්
C - ජොහැන්නස් D - මයිකල් ආංජිලෝ

(iii) ★ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් විසින් යටත් කර ගැනීම
★ වෙළඳාමේ දියුණුව
★ ධනවතුන් පිරිසක් බිහිවීම
★ බුද්ධි ප්‍රබෝධයක් ඇති වීම

(06) (i) පෘතුගාලය, ස්පාඤ්ඤය, ප්‍රංශය, බ්‍රිතාන්‍ය, ඕලන්දය

(ii) ★ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් යටත්කර ගැනීම නිසා පැවති වෙළඳ මාර්ග අවහිර වීම.
★ නව විද්‍යාත්මක සොයා ගැනීම් සමග යුරෝපයේ දේශ ගවේශන පසුබිම නිර්මාණය
★ රාජ්‍ය අනුග්‍රහය ලැබීම
★ ආගම් ප්‍රචාරය කිරීමේ අරමුණු

(iii) ★ ආසියාවේ කුළු බඩු හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය ලබා ගෙන අධික ලාභ ලැබීම
★ මුස්ලිම්වරු සතුවූ වෙළඳ ඒකාධිකාරය යුරෝපීයයන්ට ලබා ගැනීම
★ ආසියාතික රටවල තම ආගම පැතිරවීම

(07) (i) මහනුවර, කෝට්ටේ, යාපනය

(ii) ★ මායාදුන්නේගේ හා පළමුවන රාජසිංහ රජුගේ රණ ශූරත්වය
★ දළදාව සීතාවකට වැඩම කිරීම
★ සීතාවක රජවරු පෘතුගීසි විරෝධීන් වීම
★ රයිගම හා උඩරට සීතාවකට ඈඳා ගැනීම
★ කෝට්ටේ පිරිහීම

(iii) ★ විවිධ ආගමික නිකායන් පැමිණ ප්‍රදේශ වෙන්කර ගෙන ආගම ප්‍රචාරය කිරීම
★ වරප්‍රසාද, නම්බුනාම දීම ★ ප්‍රභූන් ආගමට හරවා ගැනීම
★ මිත්‍රශීලීව හැසිරීම ★ අසරණයින්ට උදව් උපකාර කිරීම
★ අධ්‍යාපනය තුළින් ආගම ප්‍රචාරය